# එල්ලේ ක්‍රීඩාව

**<u>එල්ලේ ක්‍රීඩාවේ ඉතිහාසය</u>**

1. ශ්‍රීලංකාවට පමණක් ආවේනික ශ්‍රීලංකිය ගති ලක්‍ෂණ වලින් සමන්විත වු එල්ලේ ක්‍රීඩාව ශ්‍රී ලාංකිකයන් ජන්මයෙන් මෙළවට ගෙන ආ ක්‍රීඩාවක් යැයි සැලකිම වරදක් නොවේ.

2. ශ්‍රී ලංකාව තුල ශත වර්ෂයකට පෙර පවා එල්ලේ ක්‍රීඩාව පැවති බවට නිවැරදි සාක්‍ෂි තුලින් හෙලි වි ඇති අතර ශ්‍රීලංකා වාසි ග්‍රාමිය ජනතාව අතර ඉතා ජනප්‍රිය ලෙස එල්ලේ ප්‍රචලිතව තිබු බවට ඒ තුලින් පැහැදිලි වේ. විශේෂයෙන් බක් මහ උළෙල ආශ්‍රිතව මුළු දිවයින පුරාම එල්ලේ තරග පැවැත්විමට එවකට සිටි ජනතාව පවා පුරුදුවි සිටියහ. අස්වනු නෙලාගත් කුඹුරු උස් පොල්ගස් වලින් සපිරුණු පොලුවතු වෙරළාශ්‍රිත වෙරලේ වැලිතලා, ජලය සිඳි ගිය වැව්, විශාල හිස් ඉඩම් නගරාශ්‍රිත නාගරික ක්‍රිඩාංගන ආදියෙහි එල්ලේ ක්‍රිඩාව අයත් පැරණි ජායා රූපයක් දැනට ලේඛණාරක්‍ෂක දෙපාර්තුමේන්තුවේ සංරක්‍ෂණය කර ඇත.

3. මෙසේ පැවති එල්ලේ ක්‍රීඩාවට නිසි නිති රීති මාලාවක් නොතිබිම හේතු කොටගෙන එවකට පැවති බොහෝ තරගා වලි හිදි ජය පරාජය බේද ගැනිමේදි කලහකාරී තත්වයන් හට ගැනිම හේතු වෙන් අසාරථක තරගාවලි ලෙස අවසන් විම බහුලව දක්නට ලැබි ඇත.

4. මෙවන් පසු බිමක් යටතේ 62 දශකයේ එවකට තිබු එල්ලේ සමාජ ක්‍රිඩා සමාජ එක්වි එල්ලේ සම්මේලනය ආරම්භ කර නිති රීති ක්‍රමවත් ලෙස ලේඛණගතකර එල්ලේ ක්‍රීඩාවට සම්භාවනිය තත්වයක් ලබාදි ඇත. එල්ලේ සම්මේලනයයේ ප්‍රතම සභාපති වෙස්ටු ටෙස්වි මහතාය. (එවකට පොලිස් අධිකාරි කොළඹ) මෙහි ලේඛම් දූරය හෙබවුයේ ලංකාදිප කතෘ සේන ගුණසේකර මහතාය. දිනය 1962-03-27 දින ප්‍රථම එල්ලේ සම්මේලනය ආරම්භ විය.

**<u>එල්ලේ ක්‍රීඩාවේ මූලික දක්‍ෂතා</u>**

5. පන්දුවට පහර දිම
   - අ. ධාවනය
   - ආ. පන්දුව රැකිම හා
   - ඇ. පන්දු යැවිම
   - ඈ. නිත්‍යානුකුල ලෙස පන්දුවට පහර දිම
   - ඉ. ඇතට යන සේ පන්දුවට පහර දිම
   - ඊ. සුදුසු ඉලක්කයකට පනුදුවට පහර දිම
   - උ. වේගයෙන් දිවිම
   - ඌ. සුදුසු තැන නැවතිම සඳහා දිවිම
   - ඔ. නොදැවි දිවිම
6. පන්දු රැකිම
   - අ. උඩ පන්දු රැකිම
   - ආ. බිම දිගේ යන පන්දු රැකිම
   - ඇ. එල්ලය පසු පස පන්දු රැකිම
   - ඈ. පන්දුව එල්ල කිරිම
   - ඉ. පන්දුව පාස් කිරිම
7. පනුදුව එවිම
   - අ. පන්දුව ඉලක්කයට එවිම
   - ආ. පන්දුව පිරිනැවිම

**<u>එල්ලේ ක්‍රීඩාවේ ප්‍රධාන අංග</u>**

8. ප්‍රධාන අංග 03 කි.

   අ. පිතිකරුගේ පිළ

   ආ. පන්දු රකින පිළ

   ඇ. තිරක මණ්ඩලය

**<u>උපකරණ</u>**

9. ක්‍රීඩක උපකරණ

   අ. පිත්ත

   ආ. බෝලය

10. පිටියේ උපකරණ


   අ. උණ ගසේ මහතට සමාන සමාන මිටර් 10 ක් පමණ උසවූ දැවිම් කණු (බයිස්) දෙකක්

   ආ. සෙමි 2 ක් පමණ මහත මිටර් 1 යි සෙමි 10 පමණ උස කොඩි කණු 06 ක්.

   ඇ. කුඩා කොඩි 06 ක

**<u>ක්‍රීඩා පිටිය</u>**

11. බාහිර බාධා වලින් තොරවූ විශේෂයෙන් ධාවන පථයට අවහිර නොවන සේ ඉදිරියට හා දෙපැත්තට අවම මිටර් 80 ක දුරක් එල්ලයෙන් පිටුපසට මිටර් 05 ක් සිටින සේ එල්ලය ලකුණු කර පහත දැක්වෙන ප්‍රමාණයන්ට අනුකූලව පිටිය ලකුණු කර ගත යුතුය.



**ක්‍රීඩාවේ නිති රීති.**

12. එල්ලේ ක්‍රීඩාවේ නිති රීති.

අ. එක් පිලකට උපරිම ක්‍රිඩකයන් ගණන 16 කි අවමය 12 කි. අතිරේක 04 කි.

ආ. එක් පිලක ක්‍රිඩකයින් අඩුවිම අනෙක් පිලේ ක්‍රිඩකයන් අඩු කිරීමට හේතු නොවේ.

ඇ. තුන්වන ඉනිම ඇරබිමට පෙර අඩුව පිරවිම කල හැකිවේ. එහෙත් සංවිධාකයින්ට අවශ්‍ය නම් දෙපිලේම ක්‍රිඩකයින් ගණණ 12 කට සිමා කල හැකිය.

ඈ. කාසියේ වාසිය බලා පහරදිම හෝ ඊිය රැකිමේ අයිතිය ලබාදිය යුතුවේ

**පිටිය රැකිම**

13. එල්ලයෙන් පිටුපස (බයිස් ) රැකිම සඳහා ක්‍රිඩකයෙකු අනිවාර්යයෙන් යෙදිය යුතුවේ. ඉනිම වසන් වනතුරු ඔහුට මාරුවිය නොහැකිය. සෙසු ක්‍රිඩකයින්ට එල්ලය ඉදිරිපිට ඇති හතරැස් කොටුවෙන් පිටත ඕනැම තැනක රැඳි සිටිය හැකිය. පන්දුව පිත්තේ වැදිමෙන් පසු හතරැස් කොටුව ලට පිවිස පන්දුව රැකිය හැකිය. එහෙත් ධාවකයන්ට බාධ නොවන සේ හැසිරිය යුතුවේ.

**පන්දුවට පහරදිම.**

14. ඉනිම ආරම්භයේදි දෙපිලටම අත් හදා බැලිමේ (ට්‍රයල්) නිදහස් පහරක් හිමිය. ඉන් පසුව ලකුණු රැස් කිරිම පටන් ගනි.

15. පිතිකරු එල්ලයට පැමිණිමෙන් ක්‍රිඩාව ආරම්භ කෙරේ. රකින පිලේ කවුරු අත පන්දුව තිබනුත් එම පන්දුව එල්ලයට පැමිණි පිතිකරුට භාරදිය යුතුය. එම පන්දුව තමන්ට අවශ්‍ය උස ප්‍රමාණයට අවශ්‍ය තැනට පන්දු එවන්නාට ජේනවා පන්දු එවන්නා වෙත භාර කල යුතුය.

16. පන්දු එවනු ලබන්නේ පිතිකරුගේ පිලෙන්ය. ඔහු නියමිත කවය තුල සිට පන්දු එවිම කල යුතුවේ. පිතිකරුට අවශ්‍ය විදිහට පන්දුව එවිය යුතු අතරණී පිතිකරු දැවි යාමකට පසුව පන්දු යවන්නාට මාරු විය හැක.

17. පිතිකරුට එක් වරකට ලැබෙන උපරිම පන්දු වාර ගණන 03 කි පන්දු එවන්නා බිම දිගේ එවන පන්දුවරයද අනිවාර්ය පන්දු 3 ට ගණනය කෙරේ.

18. පන්දු එවන්නා උඩින් පිරිනමන පන්දුවට බිම වදින්නට පෙර පහර එල්ල කල යුතු වේ. පිතිකරුට එල්ලයෙන් පිටුපසට වි පහර එල්ල කල හැකි වුවත් එල්ලයෙන් ඉදිරිපිට ඇති අඩකවයෙන් පිටතට එක් පාදයක් හෝ තබා පහර එල්ල කිරිම තහනම්ය.

19. පිතිකරුගේ පහරින් පන්දුව ඉදිරියට ගියේනම් ඔහු හෝ සහය ධාවකයා දිවිම ආරම්භ කල යුතු වේ.වම් අත ඇතුලට සිටින සේ ධාවකයා පිලිවෙලින් 1,2,3 යන නැවතුම් ස්ථාන පසු කරමින් ගොස් එල්ලයටත් පිනිතරුගේ වම් පැත්තේ දැවිම් කණුවන් අතරින් දැවිම් ඉර මුලු ශරිරයට පසු කර වටය නිම කල යුතුය. පිතිකරු හෝ සහය ධාවකයා වටය නිම කල පසු නැවත පන්දුවට පහර දිමේ අයිතිය ඇත.

20. ධාවකයා වටය නිම කිරීමෙන් හෝ කට්ටියක නැවතිමෙන් පසුව ඊලග පිතිකරු එල්ලයට පැමිණිය යුතුය. පිතිකරුට පන්දුව ලබා දිමෙන් පසු නැවත ක්‍රිඩාව ආරම්භ වේ.

21. එකවරව වටය නිම කල නොහැකි ධාවකයින්ට නැවතුම් වල ඉර දෙපැත්තෙන් පා දෙක බිම තබා නතර වි දැවිමකින් ආරක්‍ෂා විය හැකිය. ධාවකයා නැවතුමක් පසු කල යුක්කේ පා දෙකම නැවතුම් කණු අතරින් ගෙන යමින්ය. පසු කල නැවතුමට නැවත පැමිණය නොහැක.

22. නැවතුමක නතර වු ධාවකයාට නැවත ආරම්භ කල හැකිවන්නේ ප්ලගට පැමිණි පිති කරුගේ පහරින් හෝ දැවීමකින් පසුවය එය අවශ්‍ය වන්නේනම් පමණි එකම නැවතුමක දෙදෙනෙකුට නැවතිය නොහැකිය. දෙවැන්නට පළමු වැන්නා ඉඩ දිය යුතුය. ධාවනයේදි පළමු වැන්නා පසු කර දෙවැන්නාට ධාවනය විමට නොහැකිය.

23. පිතිකරුට අවශ්‍යනම් ප්‍රධාන විනිසුරුට දන්වා සහය ධාවකයකු යොදා ගත හැකිය. සහය ධාවකයා යොදා ගත් විට පිතිකරුට ධාවනය තහනම්ය. සහය ධාවකයා දිවිම ආරම්භ කල යුත්තේ වම පැත්තේ දැවීම් කණුව ලග ඉදිරි පැත්තේ සිටය. පන්දු යවන්නා අතින් පන්දුව යැවෙන විට සහය ධාවකයා දිවිම ආරම්භ කලත් පන්දුව පිත්තේ වදින්නට පෙර ඔහුට මධ්‍ය රේඛාව පසු කල නොහැකිය.

24. සහය ධාවකයා දැවිගිය විට ඔහුගේ පිතිකරු දැවියයි. පිතිකරුට පිටපිටම හෝ වරින් වර පන්දුවට පහර දිමේ අයිතිය ඇත. පන්දුවට පහර දිමට එල්ලයට පැමිණි පිතිකරුට එය වළක්වා එල්ලයෙන් ඉවත් විම තහනම්ය.

25. සහය ධාවකයා යෙදවු විට පන්දුවට පහරදුන් පිතිකරු එල්ලයෙන් පිටුපසට යා යුතුය.

<u>**පිතිකරුගේ දැවීම්.**</u>

26. පිතිකරුවන් දැවිමට හේතු.

අ. පිට පිට තුන් වරක් පිරිණමන පන්දුවට ප්‍රහාරය පිත්තේ නොවැදිම.

ආ. පන්දුව පිත්තේ වැදි පිටුපසට යාම

ඇ. ඉදිරියට ගිය පන්දුව හතරැස් කොටුවෙන් පිටතට නොගොස් දැවීම් රේඛාවෙන් පසුපසට යාම.

ඈ. දැවීම් කණු වල වැදි පසුපසට යාමණීදැවීම් කණු යා කරනු ලබන දැවීම් රේඛාවෙන් පිටුපසු වැදි ඉදිරියට යාම.

ඉ. පිතිකරු අඩකවයෙන් ඉදිරියට එක් පාදයක් යවා පන්දුවට පහර දිම.

ඊ. පන්දුව පිත්තේ වැදිමට පෙර සහය ධාවකයා මධ්‍ය රේඛාව පසු කිරිම.

උ. කට්ටියක නැවතිමේදි පා දෙකම කණු අතර රේඛාවෙන් එක් පැත්තකට ගෙන නතර විම.

ඌ. එක් නැවතුමක දෙදෙනාම නැවතිමෙන් පළමු ක්‍රිඩකයා දැවි යාම.

එ. පන්දු යවන්නා පන්දුව රුගෙන කවය තුළට පැමිණි පසු දිවිම.

ඒ. නැවතුමක නැවතිමේදි එක් පාදයක් පොළවෙන් උඩ තිබියදි හෝ කණු අතර රේඛාව පසු කර පා බිම තිබියදි පන්දුව ඇගේ වැදිම දැවි යාමකි.

ඔ. ධාවනයේ යෙදි සිටියදි පළමු ක්‍රිඩකයා පසු කරමින් (අණාතුරකදි හැර) දෙවනි ක්‍රිඩකයා දිවිම.

ඕ. පන්දු පහරින් බේරීම සඳහා පිටියේ සැම තැනම ධාවනය විම.

ක. ධාවකයා නිසි ආකාරයට නැවතුමේ සිටයදි හැර වටය නිම කිරිමට පෙර පන්දුව ශරීරයේ වැදිම දැවිමක් වන අතරණී පන්දුව අතේ රදවාගෙන තට්ටු කිරිම දැවි නොයාමකි.

ඛ. පිත්තේ වැදි ඉහල ගිය පන්දුව බිම වදින්නට පෙර යමක ආධාරයක් නොමැතිව අල්ලා ගැනිමදණී අතින් විසිවි ගිය පන්දුව වෙනත් ක්‍රිඩකයකු විසින් රැක ගැනිම.

ග. ක්‍රීඩකයකුගේ ඇඟේ වැදි උඩ ගිය පන්දුව රැක ගැනිමදැනී පන්දුව රැකගත් ක්‍රීඩකයා බිම වැටුනද ඔහුගේ සුරතේ පන්දුව රැදි තිබේනම් එයද දැවී යාමකි.

ඝ. පිතිකරුගේ පිළෙ ඔනෑම ක්‍රීඩකයකු තහනම් ක්‍රියාවක් කිරීමෙන් පිතිකරුගේ දැවී යාම වැලැක් විමට උත්සාහ කිරීමද පිතිකරු දැවියාමකි.

ච. පන්දුවට පහර දිමට කවය තුළට පැමිණි පිතිකරු පන්දුවට පහර නොදි ඉවත්ව යාමද පිතිකරු දැවී යාමකි.

**<u>පන්දු පහර අවලංගු කිරිම</u>**

27. පිති පහරින් ඉහල ගිය පන්දුව පිටිය තුළ පිහිටි ලිදක් වැනි (පහසුවෙන් බැසිය නොහැකි) වළකට වැටිමදැනී ක්‍රීඩකයන්ගේ උසට වැඩි තැනක බෝලය රැදිමදැනී ස්භාවය වෙනස් වන ආකාරයට පන්දුව පිති පහරින් පැලි යාම නිසාද පන්දු පහර අවලංගු වේ. එල්ලයේ සිට මීටර් 80 වකට වඩා ඉදිරියෙන් ඉහත සඳහන් සිදුවිම් සිදුවුවහොත් අවලංගු කිරීමට හේතු නොවේ.

28. ක්‍රීඩාව නතර කර තිබියදි ප්‍රධාන විනිසුරුගේ දැනුම් දිමකින් තොරව ක්‍රීඩාව ආරම්භ කර එල්ල කරන පිති ප්‍රහාරද අවලංගු කිරීමට විනිසුරුට අයිතියක් ඇත.

29. රකින පිලේ ක්‍රීඩකයන්ට අණතුරක් සිදුවේයැයි සංවිධායිකයින්ට පෙනි යන්නේනම් එල්ලයෙන් ඉදිරිපස ප්‍රදේශය තහනම් ප්‍රදේශයක් ලෙස නම් කල හැකිය“ තරගය ආරම්භ කිරීමට පෙර දැනුම් දිය යුතුය.

30. අවලංගු කරන ලද පිති ප්‍රහාරයකට ලකුණක් හෝ දැවිමක් නොමැත.

**<u>ක්‍රීඩකයින් මාරු කිරිම</u>**

31. ඉනිම් හතරේ තරගයකදි තුන්වන ඉනිම ආරම්භ කිරීමට පෙර නම් කර ඇති අතිරේඛ ක්‍රීඩකයින් තරගයට ඇතුල් කල හැකිය. ඉවත් කල ක්‍රීඩකයින් නැවත ඇතුල් කිරිම තහනම්ය. ක්‍රීඩා කරමින් සිටියදි අණතුරකට භාජනය විනම් තරගයේ අවසානය දක්වා ක්‍රීඩකයින් මාරු කිරීමේ අවසරය ලැබේ.

**<u>ලකුණු ලැබිම හා අහිමි විම</u>**

32. පිති පහරින් පන්දුව ඉදිරියට ගිය විට ධාවකයා එක් වරම වටය නිම කලේ නම් ලකුණක් හිමිවේ. එම පිති ප්‍රහාරය දැවිමක් නම් වටය නිම කලත් ලකුණක් හිමි නොවේ.

33. නිති විරෝධි ලෙස ධාවනය වෙමින් ලබන ලකුණුදැනී නිති විරෝධි පන්දුවකින් ලබන ලකුණද අහිමි වේ.

34. රකින පිළ ඔනැකමින් අවහිර කර නොලැබු ලකුණු ලබා දිමටදැනී රකින පිළට අවහිර කර ලබන ලකුණු අහිමි කිරීමටද විනිසුරු මඩුල්ලේ තිරණයකි.

**<u>තරගය නිම කිරිම</u>**

35. වැඩි එක් ලකුණකින් ජය පරාජය විසදේනී ජය පරාජය විසඳන විට තරගයද නිම කල යුතුය.

36. පළමු ඉනිම් දෙකේ ලභාගත් ලකුණු අනුව තුන්වන ඉනිම ආරම්භ කරන පිළිවෙල වෙනස් විය හැකිය. පළමු ඉනිම ආරම්භ කල පිළ ලකුණු ගණනින් හරි අඩක් වැඩියෙන් දෙවන ඉනිම ආරම්භ කල පිළ ලභා නොගත්තේනම් තුන්වන ඉනිම ආරම්භ කරන්නේ දෙවන ඉනිම ආරම්භ කල පිළමය. (නිදසුන් :- 8/15, 11/20 යනාදි පිළිවෙළට ලකුණු ලබා ගත්තේනම් ඉනිස් දිමක් නැත) ඉනිස් දුන් පසු තුන්වන ඉනිමේදි ලකුණු ඉක්මවා ගියේනම් ඊට පිළිතුරු දිමට පළමු ඉනිම ආරම්භ කල පිළට ඉඩදිය යුතුය.

37. ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණවත් වේයැයි සැළකියෙනම් සියළුම ක්‍රීඩකයන් දැවී නොසිටියත් ඉනිම අවසන් කර අනිත් පිළට පන්දුවට පහර දිමේ අයිතිය පැවරිමට නායකයාට තිරණය කළ හැකිය

ප්‍රධාන විනිසුරු ගත් තිරීණයක්නම් ඉතිරි ක්‍රිඩකයන්ට පන්දුවට පහර දිමේ අවශ්‍යතාවයක් ඇති වුවහොත් එසේ කළ යුතුය.

**සීමිත පන්දු වාර තරග**

38. තරගයක සීමිත පන්දු වාර ගණන.

අ. ඉනිමක පන්දු වාර ගණන 40 කි.

ආ. එක් දිනකට තරගය සඳහා කැඳවිය හැක්කේ කණ්ඩායම් 8 කි.

ඇ. ලකුණු සම වු විට පන්දු වාර පහකට සිමා වු තරගයක් පැවැත්විය යුතුය. වෙනත් වට වලදි පන්දු වාර 40 හ අඩු නොකල යුතුය.

ඈ. පන්දු වාර ගණන නිම විම ඉනිමේ අවසානයයි.

**නිති පිළිබදව විශේෂ නිගමන**

39. ක්‍රිඩා පිටියේ පිටුපස සිමා කෙරෙන්නේ දැවිම් කණු දෙකෙන් හා ඒ අතර ඇති දැවිම් රේඛා වෙන්යණී කණු දෙකේ උස ඉහලටම අයත්ය.

40. බිම වෙනුවෙන් සළකණුයේ ක්‍රිඩකයින්ගේ උසට අඩු නිශ්චල තැන්යණී ක්‍රිඩකයින්ගේ සියළුම ඇදුම් පැළදුම් ශරිරය වශයෙන් සැළකේ.

41. දැවිම් කණු හෝ කට්ටි කණු ස්පර්ෂ විමණී ගැළවිම දැවිම් වලට හේතු නොවේ නැවතුමක එක් පාදයෙකින් සිදු විමට ගිය වරද නිවැරදි කර ගත හැකිය“ නැවතිමේදි එක් පාදයක් එසවිම වරදක් නොවේ.

42. පන්දුවට පහර දිමේදි පිත්ත අතින් විසිවිමණී පිත්ත රැගෙන දිවිමණී දැවිමකට හේතු නොවේ. එයින් වැළකි සිටිමද පිතිකරු කල්පනාකාරි විය යුතුය. පිත්තේ වැදුනු පන්දුව දැවිම් රේඛාවේ වැදි ඉදිරයට යාම ක්‍රිඩකයකුගේ ශරිරයේ වැදි පස්සට යාමණී කට්ටි කණු වල වැදි පස්සට යාම දැවිමක් නොවේ.

43. බිම වැදුනු පන්දුවට පහර දිම පන්දුව අතේ වැදිම නිත්‍යානුකුල පහරක් නොවේ.

44. ධාවනය කළ යුතු අවස්ථාවක විශේෂයෙන් ඉනිම අවසානයේ ධාවකයින් නැවතුමේ නතර වි සිටිම ධාවනය නවත්වා ඉවත් විමණී දැවියාමකි.

45. කණ්ඩායම් දෙකටම පොදු පන්දු භාවිතා කල යුතුය. පන්දු රත් කිරිම වර්නවත් කිරිම තහනම්ය.

46. පසු පාදයේ කොටසක් ඇගිල්ලක් බයිස් රේඛාව මතද ඉදිරි පාදයේ කොටසක් අඩ කවයේ රේඛාව මතද තිබිම දැවියාමකට හේතු නොවේ.

47. ධාවකයන්ට අවහිර කිරීමෙවන් හා වඩාත් වේගවත්ව පන්දුවෙන් දමා ගැසිමෙන් රකින පිළේ ක්‍රිඩයින් වැළකි සිටිය යුතුය. එසේ පිති කරුවන්ද තමන්ට නියමිත ස්ථානයේ නොසිට රකින පිළේ ක්‍රිඩකයින්ට අවහිර නොකල යුතුය. ධාවනය කරද්දි රකින පිළේ ක්‍රිඩකයකුගේ ශරිරයේ වැදි වැටුනොත් කික්‍රිඩකයාට පන්දුවෙන් ගසා දැවිම නොකල යුතුය.

48. වැරදිමකින් යුතුව දෙනු ලබන තිරණයක්දණී විනිසුරුගේ ශරිරයේ වැදි දෙනු ලබන තිරණයක්ද වෙනස් කිරිම විනිශ්ච මණ්ඩලය.

49. ප්‍රධාන විනිසුරුට දන්වා නම් කල අතිරේඛ ක්‍රිඩකයන් තුන්වන ඉනිම ආරම්භ කිරිමට පෙර යොදා ගත හැකිය“ ඉවත් වු ක්‍රිඩකයන්ට නැවත පැමිනිය නොහැක ක්‍රිඩා පිටියේ සිදු වු අනතුරකදි ඕනෑම අවස්ථාවක මාරුවිම් කළ හැකිය.

50. සංවිධායිකයින්ට අවශ්‍යනම් මුලික තරග ඉනිම් දෙකකටද ඉනිමක කාළය විනාඩි 35 කට පන්දුවාර 40 ය නියමිත පන්දු වාර තරගයකටද සිමා කල හැකිය.

51. ක්‍රීඩාව තාවකාලිකව නැවති තිබියදී කට්ටි වල නැවති සිටි ධාවකයින් ධාවනය ආරම්භ කර ඇත්නම් ඔවුන් පළමුව සිටි තැන්වලට යැවිය යුතුය. ඒ අවස්ථාවේ රකින පිළ පන්දුවෙන් දමා ගැසුවේනම් ක්‍රීඩාව නවතා නැත.

52. කට්ටියක නැවති සිටින ක්‍රිඩකයකුට තමන්ට කැමති අයුරින් පැත්ත මාරු කල හැකිය. එම අවස්ථාවේ පන්දුවෙන් දමා ගැසිම නොකල යුතුය.

53. වේගයෙන් ධාවනය වු ක්‍රිඩකයකු කට්ටයක නැවතිමට යාමේදි පා ඇදි යාමක් එක් පාදයක් එසවිමත් කට්ටියේ නැවතිම ලෙස සැළකිය නොහැක.

54. නිති මාලාවට අයත් තහනම් ක්‍රියාවක් පිතිකරුගේ පිළෙන් සිදු වුවහෝත් දැවිමකට හෝ ලකුණු අහිමි කිරිමටදණී රකින පිළෙන් නොදැවිමකටණී ලකුණු හිමි කිරිමටද ප්‍රධාන විනිසුරුට අයිතියක් ඇත.

55. ප්‍රධාන විනිසුරුගේ අවසරයක් නොමැතිව නිති විරෝධිව ක්‍රිඩකයින් යෙදවිමෙන් හෝ පන්දු භාවිතා කිරිමෙන් වරදකට හසු වන පිළ පරාජය වන පිළක් සේ ලකුණු ලැබේ.

56. පිතිකරු අඩකවයේ සිට පහර දෙද්දි ඉදිරියෙන් තබන පාදය පතුලේ ඇගිලි කොටසක් හෝ අඩකවයේ රේඛාව මත තිබේනම් දැවියාමකට හේතුවක් නොවේ.

57. සහය ධාවකයා පන්දුව එවිමට පෙර මග සිට ධාවනය ආරම්භ කිරිම නිති විරෝධි ධාවනයක් නිසා ලකුණු අහිමි විමට ඉඩ ඇත.

58. පිලේ සියළුම ක්‍රිඩකයින් අංක සහිත ඒකාකාරි ඇදුමකින් සැරසි සිටිය යුතුය. කොට කලිසම්ණී අත් කොට බැනියම්ණී අවශ්‍යනම් සපත්තු මේස් පැළදිය හැකිය. යකඩ ඇණ සහිත සපත්තු පැළදිය නොහැක.

59. විනය කඩ කරන ක්‍රිඩකයින්ට අවවාද කර කහ පැහැති කාඩ් පත් පෙන්විම රතු පැහැති කාඩ් පත පෙන්වා ක්‍රිඩා පිටියෙන් ඉවත් කිරිමද කළ හැකි. එසේ ඉවත් කරනු ලබන ක්‍රිඩකයා වෙනුවට අතිරේඛ ක්‍රිඩකයකු යෙදවිය නොහැක.

**ප්‍රධාන විනිසුරුගේ කාර්‍යයන්**

60. විනිසුරුවන්ගේ රාජකාරි පහත දක්වා ඇත.

අ. ක්‍රිඩා පියටියේ හා ක්‍රිඩා උපකරණ වල සුදුසුකම් පරික්‍ෂා කර බැලිම.

ආ. අවශ්‍ය ප්‍රමාණයට සහය විනිශ්ච කරුවන් සුදුසු තැන් වල යෙදවිම.

ඇ. සම්මත නිති රිති හා සම්ප්‍රදායන් ආරක්‍ෂා කරමින් තරගය ආරම්භ කිරිම. ලකුණු හිමි කිරිම හා අහිමි කිරිම. පන්දු වාර අවලංගු කිරිම හා දැවිම් පෙන්විමණී තරග නැවැත්විමණී ජය පරාජය විසදිම.

ඈ. තරගයට බාධා වන කරුණු පිළිබදව අවධානය යොමු කර එම භාධාවන් ඉවත් කිරිම.

ඉ. ක්‍රිඩාව අවහිර කරන හෝ නිති විරෝදි ක්‍රිඩා කරන්නන් ඉවත් කිරිම.

ඊ. දැවිමක් සිදු වේයැයි කියා සිතන ස්ථාන වලට ගෝස් තිරණ ලබා දිම.

එ. අවශ්‍ය අවස්ථාවන් වලදි උප විනිසුරුවන්ගෙන් විමසිම.

ඒ. ක්‍රිඩකයන්ගේත්ණී නරඹන්නන්ගේත් අවධානය යොමු කර ගැනිම සදහා නලාව ශබ්ද කිරිම. ඉනිමේ අවසානය ලගා වි ඇති බව ප්‍රකාශ කිරිම.

ඔ. ලකුණකට සුදු කොඩියත්ණී දැවිමකට රතු කොඩියත් එසවිම. ලකුණක්හෝ දැවිමක් නැති විට කොඩි දෙකම වැවිමෙන් ප්‍රකාශ කිරිම.

ඕ. තරග අවසාන වන තුරු සියළුම කටයුතු පාළනය කිරිම.

# සමාප්තයි